**මාධ්‍ය නිවේදනය**

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.06.30 |

# කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2023 ජූනි මාසයේදී ද තියුණු පහළ යෑමක් වාර්තා කළේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 මැයි මාසයේ වාර්තා වූ සියයට 25.2හි සිට 2023 ජූනි මාසයේ දී සියයට 12.0 දක්වා පහළ යෑමක් වාර්තා කළේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, 2023 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 මැයි | 2023 ජූනි |
|---|---|---|
| දර්ශක අගය | 192.3 | 192.3 |
| මාසික වෙනස (%) | 0.0 | 0.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 25.2 | 12.0 |

වසර දෙකකට පසුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 මැයි මාසයේ පැවති සියයට 21.5හි සිට 2023 ජූනි මාසයේ දී සියයට 4.1 දක්වා තනි අගය මට්ටමකට පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 මැයි මාසයේ පැවති සියයට 27.0හි සිට 2023 ජූනි මාසයේ දී සියයට 16.2 දක්වා තවදුරටත් පහළ ගියේය. 2023 ජූනි මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, සියයට 0.02ක් ලෙස වාර්තා වූ අතර මෙම සුළු මාසික වෙනස සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි වාර්තා වූ සියයට 0.41ක මිල ඉහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි දක්නට ලැබුණු සියයට -0.39ක මිල අඩුවීම මගින් තුලනය වීම හේතු විය. ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 මැයි මාසයේ පැවති සියයට 20.3හි සිට 2023 ජූනි මාසයේ දී සියයට 9.8 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




දැනට පවතින තොරතුරු අනුව, 2023 වසරේ තුන්වන කාර්තුව මුල් භාගයේදී උද්ධමනය තනි අගයක මට්ටමට අඩු වී නිර්උද්ධමන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවීමට අපේක්ෂිතය. මෙලෙස උද්ධමනය පහළ යෑම කෙරෙහි දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, බලශක්ති මිල හා ආහාර මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑම් සහ ඒවායේ පසු බලපෑම්, සහ විනිමය අනුපාතිකය අධිප්‍රමාණය වීම හේතුවෙන් භාණ්ඩ හා සේවාවල සිදු විය හැකි මිල සංශෝධන, මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් ද සහාය වනු ඇත.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. විශේෂයෙන්ම, සැපයුම් තත්ත්වයන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් වීම, අපේක්ෂිත මට්ටම්වලට වඩා වැඩි වශයෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල පහළ යෑමේ හැකියාව සහ ඒවා දේශීය මිල ගණන් වෙත සම්ප්‍රේෂණය වීම යනාදී කරුණු හේතුවෙන් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය. කෙසේ වෙතත්, අපේක්ෂිත ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ඇතිවිය හැකි ඉල්ලුම් පීඩන සහ ආනයන සීමා ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමට ඇති හැකියාව හේතුවෙන් අපේක්ෂිත පුරෝකථනයන්ට වඩා උද්ධමනය ඉහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය.

***මූලය:** ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමත් සමගම මහ බැංකුව එහි මැදි කාලීන ආර්ථික පුරෝකථන කාර්තුමය පදනමින් සංශෝධනය කරයි. මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇති පුරෝකථන මගින් පවතින දත්ත සහ 2023 වසරේ අප්‍රේල් මාසයේ පුරෝකථන වාරයේ දී සිදු කරන ලද උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. මෙම පුරෝකථන 2023 ජූලි මස මුලදී පැවැත්වෙන මුදල් ප්‍රතිපත්ති වාරයේ දී යාවත්කාලීන කෙරෙනු ඇත.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වූ දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර 2023 වසරේ පළමු කාර්තුව සඳහා වූ දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

**උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | ජූලි | 178.9 | 160.9 | 4.2 | 4.0 | - | - |
| | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව